සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ……………………………… විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ………………………

සැලකිය යුතුය .

1 කොටසෙ ප්‍රශ්න 15ටම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව 11/ 111/ 1V කොටස් වලින් තමා ඉගෙන ගන්නා ප්‍රධාන නර්තන සම්ප්‍රදායට අයත් කොටසට පිළිතුරු සැපයිය යුතු ය.

## I කොටස

1 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) මහනුවර දළදා පෙරහැර පවත්වනු ලබන්නේ,
   1) වෙසක් මාසයේ ය.
   2) පොසොන් මාසයේ ය.
   3) ඇසල මාසයේ ය.
   4) දුරුතු මාසයේ ය.

2) ද්‍රවිඩ ජනයාගේ ආගමික උත්සවයකි.
   1) රාමසාන්
   2) නවරාත්‍රී
   3) නත්තල්
   4) වෙසක්

3) " රත්න දීප ජන්ම භූමි.................." ගීතයේ පද රචනය සිදුකරන ලද්දේ,
   1) මහගම සේකර මහතා ය.
   2) ඩබ්. ඩී. අමරදේව මහතා ය.
   3) ලයනල් අල්ගම මහතා ය.
   4) ආනන්ද සමරකෝන් මහතා ය.

4) වේගයෙන් භ්‍රමනයවන නළඟනකගේ නර්තන විලාසයක් දැක්වෙන ලෝකඩ ප්‍රතිමාවක් සොයාගෙන ඇත්තේ,
   1) සූතිඝර චෛත්‍යයෙනි.
   2) කුට්ටම් පොකුණෙනි.
   3) සිංහ පොකුණෙනි.
   4) කොට වෙහෙරෙනි.

5) භය නැමැති ස්ථායී භාවය නිරූපනය කිරීමේ දී ප්‍රදර්ශනය වන ලක්ෂණයකි.
   1) දැස් අඩවන් වීම.
   2) සිනහ සීම.
   3) අත් පා ලිහිල් වීම.
   4) ඇස් විශාල වීම.

6) "සොළසා සංඛ්‍ය පළමුව පෙරුම් පිරූ බලයෙන්දා.................." යන කවි පදය අයත් වන්නේ,
   1) සවරම් ගායනයට ය.
   2) පතුරු ගායනයට ය.
   3) සිරස පාද ගායනයට ය.
   4) මල්යහන් ගායනයට ය.

7) භරත නාට්‍යම් සම්ප්‍රදායේ ගුරුවරයා හඳුන්වනු ලබන්නේ,

1) නට්ටුවනාර් නමිනි. 2) මුත්තුකාරන් නමිනි.

2) පත්තුකාරන් නමිනි. 3) දේවදාසින් නමිනි.

8) දේශීය ශාන්තිකර්මවල සැරසිලි සඳහා භාවිත කරන ස්වභාවික අමුද්‍රව්‍ය දෙකකි.

1) කාඩ්බෝඩ් හා ගොප්කොළ 2) කෙසෙල් කොට හා හබරල කොළ

3) ලී කෝටු හා යකඩ ඇණ 4) පුවක් මල් හා රබර් ගස්

9) වෙස් බැඳි නැට්ටුවෙකුගේ හා තිළියකගේ රූපයක් කැටයම් කර ඇත්තේ

1) ඇම්බැක්ක දේවාලයේ ය. 2) පොල්වත්ත පන්සලේ ය.

3) මුල්කිරිගල විහාරයේය ය. 4) පනාවිටිය අම්බලමේය.

10)



ඉහත රූපසටහනේ දැක්වෙන භරත නාට්‍යම් සම්ප්‍රදායයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වනුයේ

1) මද්දලය යි. 2) ගැට බෙරය යි.

3) මෘදංගය යි. 4) දිග් බෙරය යි.

අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල සඳහන් කරුණු හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.

11) නර්තනයට අවශ්‍ය පරිදි ශරීරාංග හැඩගස්වා ගැනීමට නම්‍යතා අභ්‍යාස ඉතා වැදගත් වේ. ( )

12) පහතරට බෙරයේ වම් මුහුණත සුරල් තට්ටුව ලෙස හඳුන්වයි. ( )

13) "දීකිරි දීකිරි ගෙනාව දීකිරි" .......... ගීතය අනුලා බුලත්සිංහල මහත්මිය විසින් ගායනා කරයි. ( )

14) මැදුම් තනි තිතට තාල තැබීමේ දී තාලම්පටින් වාදනය කරනුයේ "තෙයි" ධ්වනිය යි ( )

15) පා සරඹ නර්තනය බෙර වාදනයට අනුව සිදු කරයි. ( )

(1x15)

## 11 කොටස - උඩරට නර්තනය

**16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර හිස් තැනෙහි ලියන්න.**

16) වෛරෝඩි වන්නම මාත්‍රා ..................................................... ට නර්තනය කරයි.

17) ගැට බෙරයෙන් නිකුත්වන සතර බීජාක්ෂර වනුයේ ..................................................... ය.

18) ..................................................... මහතා ගොයම් කැපීමේ නැටුම නිර්මාණය කළේය.

19) අවුල්හැරය අයත් වනුයේ .................................... ඇඳුම් කට්ටලයට ය.

20) ගුරුගේ මාලාව .....................................................ශාන්තිකර්මයේ එන නාට්‍යමය පෙළපාළියකි.

(1 x 5)

## 111 කොටස - පහතරට නර්තනය

16) ඊශ්වර කුණ්ඩතාලය මාත්‍රා .................................... ට නර්තනය කරයි.

17) පහතරට බෙරයෙන් නිකුත්වන සතර බීජාක්ෂර වනුයේ ..................................................... ය.

18) ..................................................... මහතා හෙළ රසාංග ප්‍රසංගය නිර්මාණය කරන ලදී.

19) කාගුල් කුට්ටම අයත් වනුයේ .................................... ඇඳුම් කට්ටලයට ය.

20) මරා ඉපැද්දීම ..................................................... ශාන්තිකර්මයේ එන නාට්‍යමය පෙළපාළියකි.

(1 x 5)

## 1V කොටස - සබරගමු නර්තනය

16) කදම්භපක්ෂි වන්නම .................................... ට නර්තනය කරයි.

17) සබරගමු දවුලේ නිකුත්වන සතර බීජාක්ෂර වනුයේ ..................................................... ය.

18) ..................................................... මහතා සමන් දේවාල රාජකාරි නැටුම් කණ්ඩායම් භාරව කටයුතු කළේය.

19) හැඩකැල්ල අයත් වනුයේ .................................... ඇඳුම් කට්ටලයට ය.

20) අසුර යක්කම ..................................................... ශාන්තිකර්මයේ එන නාට්‍යමය පෙළපාළියකි

(1 x 5)

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව මුළු ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

1 ) ඔබ විසින් සිදුකළ ගොප් සැරසිල්ලක් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) ගොප් කොළ යොදා ගනිමින් කරනු ලබන සැරසිලි දෙකක් නම් කරන්න (ල.02)

2) එම සැරසිල්ල නිර්මාණය කිරීමට යොදා ගන්නා අමු ද්‍රව්‍ය තුනක් නම් කරන්න. (ල.03)

3) ඔබ නම් කළ සැරසිල්ලක් නිර්මාණය කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල.03)

4) එම සැරසිල්ලේ රූප සටහනක් අඳින්න. (ල.02)

2) 1) ඔබ උගත් සම්ප්‍රදායට අදාළව මාත්‍රා 3 තනි තිතට අයත් බෙර පදයක් /දවුල් පදයක් නියමිත තාල රූපයට අනුව ප්‍රස්තාර කරන්න. (ල.02)

2) "සූරිය කුල ඇති හිරු දෙවියන්නේ

පැවිය අංසක ලොව පවතින්නේ...................යන කවි පද මාත්‍රා 4 තනි තිතට ප්‍රස්තාර කරන්න. (ල.04)

3) සුළු තනි තිතට අයත් අඩව්වක් හෝ ඉරට්ටියක් හෝ කලාසමක් ප්‍රස්තාර කරන්න. (ල.04)

3) 1) භරත නාට්‍යම් සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ල.02)

2) එම සම්ප්‍රදාය හා බැඳි සංගීත ශෛලිය හා නර්තන අංග දෙකක් නම් කරන්න. (ල.04)

3) තන්ජාවූර් සහෝදරයන් නම්කර, ඔවුන් සිදු කළ සේවය කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

4) 1) පහන් මඩු ශාන්තිකර්මය අතීතයේ හා වර්තමානයේ පැවැත්වීමට හේතු එක බැගින් ලියන්න. (ල.02)

2) කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ එන ගායනය සහිත සහ රහිත නර්තනාංග දෙක බැගින් ලියන්න. (ල.04)

3) දෙවොල් මඩු ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතාව ලියන්න. (ල.04)

5) 1) සවරං කවියක් ලියන්න. (ල.02)

2) සිංහල ගැමි නැටුමකට සමාන ද්‍රවිඩ ගැමි නැටුමක් නම් කර, එහි සමාන හා අසමානතා එක බැගින් ලියන්න. (ල.04)

3) පතුරු හා සවරං නර්තනය සඳහා භාවිත කරන රංග උපකරණ නිර්මාණය කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ල.04)